# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PF/FD/04/240
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2016.07.29

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක:- 07/2016

සියළුම අමාත්‍යංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ

විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන්,

**ව්‍යවස්ථාපිත සහ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය කිරීම - 2016 අයවැය යෝජනා**

2016 අයවැයෙහි යෝජනා අංක 425 හා 426 මගින් පාර්ලිමේන්තුවේ පිලිගත් ක්‍රියාදාමයකට අනුකූලව සියළුම ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පාර්ලිමේන්තු පාලනයට යටත් කිරීම සහතික කිරීම පිණිස එම අරමුදල් සමාලෝචනය කිරීමට යෝජනා කර ඇත.

02. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය හා අවසන් වරට නිකුත්කල අංක 1933/13-2015 හා 2015.09.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් මුදල් අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව අමාත්‍යංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතනවල පවත්නා සියළුම ව්‍යවස්ථාපිත, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් හා භාර අරමුදල් සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත්කර ඇත.

03. දැනට පවතින අරමුදල් තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය තහවුරු කිරීම සඳහා එකී අරමුදල් ස්ථාපිත කර ඇති පාර්ලිමේන්තු පනත්, ගිවිසුම් හා ගැසට් නිවේදන සමාලෝචනය කිරීමත් ඒවා වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමත් එකී අරමුදල් පාර්ලිමේන්තු පාලනයට යටත් කිරීම සහතික වීම පිණිස වන සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමත් හා ඒ සඳහා වන නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමත් අරමුදල් සමාලෝචනය පිණිස පත්කර ඇති කමිටුවේ කාර්ය භාරය වේ.

04. ඒ අනුව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් ලෙස ඔබ ආයතනය යටතේ පවතින ව්‍යවස්ථාපිත, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් හා භාර අරමුදල් සමාලෝචනය කිරීම පිණිස,

අ. අරමුදල් පිහිටුවීමට අදාල පනත්, භාර ඔප්පු, එකඟතා ගිවිසුම් හා අදාල අමාත්‍ය මණ්ඩල තීරණ හෝ පාර්ලිමේන්තු යෝජනා

ආ. අරමුදල්වල සංයුතිය, අරමුණු, කාර්යයන් හා වාර්ෂික වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන යනාදී විස්තර

අරමුදල් සමාලෝචනය කිරීමට පත් කරන ලද කමිටුවේ සාමාජිකයන්ට ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

05. මෙම ජාතික කර්තව්‍යය කඩිනමින් ඉටු කිරීම අවශ්‍ය වන බැවින්, මෙම චක්‍රලේඛයට ඇමුණුම් ලෙස ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර ඔබ ආයතනය යටතේ පවත්නා අරමුදල් පිළිබඳව තොරතුරු මෙම චක්‍රලේඛය නිකුත් කල දින සිට දින 14 ක් ඇතුලත රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි. එසේම, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් යටතේ ඉහත සඳහන් අරමුදල් නොපවතින්නේනම් ඒ පිළිබඳවද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කල යුතු ය.

06. මෙම චක්‍රලේඛය පිළිබඳ තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2484614 මගින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් හා 011-2484618 මගින් අරමුදල් භාර අධ්‍යක්ෂ ඇමතිය හැකි අතර මෙම චක්‍රලේඛය හා අදාල ඇමුණුම මහා භාණ්ඩාගාර වෙබ් අඩවියෙන් (www.treasury.gov.lk) බාගත කල හැකිය.

ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් අමාත්‍යංශයේ ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

# Funds Reviewing Form

| | |
|---|---|
| 1. | **General**<br><br>Name of the Fund -<br>Ministry -<br>Department/Institution -<br>Incorporation - Statuary / Non Statuary / Trust<br>Empowering Act / Ordinance if any -<br>Official Address - |
| 2. | **Governance Structure - Board of Management/Trustees/Other (Please specify)** |

| Contact Information | Name | Phone Number |
|---|---|---|
| Chairman | | |
| CEO | | |

| | |
|---|---|
| 3. | **Ownership Composition of the Fund**<br><br>i *Government*<br>ii *Other Stake Holders (Please specify percentage)* |
| 4. | **Objectives of the fund** |
| 5. | **Present Activities / Services of the fund** |
| 6. | **Major Sources of Receipts to the fund according to last Annual Account(if 2015 are not find out give the latest year)** |

| | Source | Amount (2015) |
|---|---|---|
| *i* | *Government Grant/levy if any* | |
| *ii* | *Foreign Funding if any* | |
| *iii* | *Interests on Investments* | |
| *iv* | *Sale Proceeds* | |
| *v* | *Any other (Please specify)* | |
| *vi* | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7. | Major Expenditure Items and Amounts of last three years | | | | |
| | i | Expenditure on major objectives (eg. grants/subsidies services to third parties) | | | |
| | ii | **Operational Cost** | | | |
| | | Personal Cost | | | |
| | | Finance Cost | | | |
| | | Other Operational Costs | | | |
| 8. | Operational excess/deficits of last three years | | | | |

| | | | |
|---|---|---|---|
| 9. | Major Activities/Projects/Beneficiaries | | |
| | | **Project** | **Beneficiary** |
| | i | | |
| | ii | | |
| | iii | | |
| | iv | | |
| | v | | |
| 10. | **Audit Arrangement** | | |
| | i | External | Auditor General/Private |
| | ii | Internal | |
| | iii | Relevant provisions | |
| 11. | Human Resources as at 1st July 2016 | | |
| | i | Total no. of the cadre approved by Treasury / Ministry if any | |
| | ii | Total no. of employees paid from the fund | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12. | Details of total no. of employees paid from the fund | | | | |
| | **Level** | **Permanent** | **Casual** | **Contract** | **Other** |
| | Labour Grades | | | | |
| | Clerical & allied Grades | | | | |
| | Junior Mgt Grades | | | | |
| | Senior Mgt Grades | | | | |
| | Any other Grades | | | | |
| | Board | | | | |

| | | | |
|---|---|---|---|
| 13. | **Balance Sheet as at 31st Dec 2015 (if not available the latest final accounts)** | | |
| | i | Total value of cash assets | |
| | ii | Total value of non-cash assets | |
| | iii | Total value of liabilities | |
| | iv | Net Assets | |

| | | | |
|---|---|---|---|
| 14. | **Details of Cash Assets** | | |
| | i | Balances on 1st July 2016 | |
| | ii | Bank Current Accounts | |
| | iii | Bank Savings Accounts | |
| | iv | Bank Fixed Deposit Accounts | |
| | v | Treasury Bills | |
| | vi | Any other Cash Investment | |
| 15. | **Major Audit Issues if any** | | |
| | i | Audit Opinion on annual accounts in most recent year | |
| | ii | Any other issues | |
| 16. | **Reasons why this fund should continue** | | |
| 17. | **Changes recommended to the legislation/statute if any** | | |
| 18. | Contact person to obtain clarifications/further information on the above<br>Name:<br>Designation<br>Contact Number | | |

…………………………….

Head of the Fund